**සාරය:** සුමිහිරි දරුවනි, සැමවිටම සතුටින් සිටිමින් අන් අයටත් සතුටම දානය කරන්න. සැම කෙනෙක්ටම අනුකම්පා කරනවා කියන්නේ මෙයයි. කාට හෝ නිසි මග පෙන්වාදීම තමයි ලොකුම පින.

**ප්‍රශ්නය:** නිරන්තර සතුටින් සිටිය හැක්කේ කාටද?, සතුටින් සිටීමේ මග කුමක්ද?

**පිළිතුර:** ඥානයෙන් ඉතා දක්ෂ හා කතාන්දරයක් ලෙසින් නාටකය හොඳින් මතක තබා ගෙන සිටීමට දන්නා අයට නිරන්තරව සතුටින් සිටිය හැකියි. නිරන්තර සතුටින් සිටීමට නම් පරම පියාගේ ශ්‍රීමත් නොකඩවා පිළිපදින්න. තමා ජීවයක් බව සලකා පරම පියා විසින් ඔබට පැහැදිලි කරනා සැම දෙයක්ම ඉතා හොඳින් ධාරණය කර ගන්න. ඥාන සාගරය කැලඹීමෙන් ඔබට සතුටින් සිටිය හැකි වේවි.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා ආධ්‍යාත්මික දරුවන් සමග හෘදයාංගම කතා බහක නිරතව සිටිනවා. එකම එක පරම පියා පමණක්ම අපගේ පියා වන බවත් ඔහු අපට මෙම ගුරුහරුකම් දෙන බවත් ඔය ජීවාත්මයන් දන්නවා. ගුරුවරයෙකුගේ රාජකාරිය ඉගැන්වීම වන අතර ගුරු කෙනෙකුගේ රාජකාරිය වන්නේ ඔබට ඔබගේ ගමනාන්තය පෙන්වා දීමයි. ඔය දරුවන් ඔබගේ ගමනාන්තය තේරුම් ගෙන සිටිනවා. මුක්තියත් ජීවන මුක්තියත් සඳහා ස්මරණ වන්දනාව අනිවාර්යයෙන්ම අවශ්‍ය වෙනවා; දෙකම පහසුයි. උපත් 84 චක්‍රය නොනවත්වාම කැරකෙනවා. උපත් 84 අපගේ චක්‍රය දැන් අවසන් වෙමින් පවතින බවත් අප දැන් නැවතත් නිවහන බලා යා යුතු බවත් ඔබ මතක තබා ගත යුතුයි. කෙසේවෙතත්, පාපකාරී ජීවයන්ට මුක්තියට හෝ ජීවන මුක්තියට යන්න බැහැ. මේ ආකාරයෙන් ඔබ ඥාන සාගරය කැලතිය යුතුයි. මෙය කරනා අය ත්‍යාගය හිමි කර ගනීවි. ඒ අය තමයි තමනුත් සතුටින් සිටිමින් අන් අයවත් සතුටු කරවන්නේ. අන් අයට මාවත පෙන්වීමට ඔබ තුළ ඔවුන් කෙරෙහි අනුකම්පාවක් තිබිය යුතුයි, අති උතුම් සුබ කාලය සංගම යුගය මෙය බව ඔය දරුවන් දන්නවා. ඇතැම් අයට මෙය මතකයි, ඇතැම් අයට මතක නැහැ. ඔවුන්ට එය අමතක වෙනවා. මේ තරමක දෙයක් හෝ ඔබ සිහියේ තබා ගෙන සිටිනවා නම්, ඔබගේ සතුටේ රසදිය කඳ ඉහළින්ම තිබේවි. ගුරුවරයා හා පරම ගුරු යන ස්වරූපයෙනුත් ඔබ පරම පියාව සිහි කරනවා නම්, එවිටත් ඔබගේ සතුටේ රසදිය කඳ ඉහළින්ම තිබේවි. කොහොමනමුත්, ඉදිරියට යන අතර යම් යම් පටලැවිලි ඇති වෙනවා. කන්දක ඉහළට නැග පහළට බැසිය යුතු වන්නාක් සේ දරුවන්ගේ තත්ත්වයත් ඒ වගේමයි. ඇතැම් අය ඉහළටම නැග ආපසු ඇද වැටෙනවා. ඔවුන් සිටිය තත්ත්වයටත් වඩා පහළට ඇද වැටෙනවා. ඉපැයූ සැම දෙයක්ම ඉන් අවසන් වී යනවා. කොපමණ දානමාන දී තිබුණත් පින් දහම් කර තිබුණත් ඒ පින් කරනා අතර පාපකාරී ක්‍රියාත් කිරීමට පටන් ගතහොත් කළ පින් සියල්ල ඉන් අවසන් වී යනවා. ලොකුම පින නම් පරම පියාව සිහි කිරීමයි. පින්වත් ජීවයක් වන්නේ ඒ සිහි කිරීමෙන් පමණයි. තමා විසින් තබා ගෙන සිටිනා අයගේ ආශ්‍රයේ බලපෑමට හසු වී එක පිට එක වැරදිම කරන්න පටන් ගතහොත් ඔබ මීට පෙර සිටි තත්ත්වයටත් වඩා පහළටම ඇද වැටේවි. එවිට එම ගිණුමේ කිසිවක් ඉතිරි වන්නේ නැහැ; පාඩුවක්ම පමණයි. පාපකාරී ක්‍රියාවක් කළ විට පාඩු විඳීමට සිදු වෙනවා; ඔබගේ ගිණුමට පව් රුසක් එක් රැස් වෙනවා. ගිණුම් බලා ගත යුතුයි. පරම පියාත් කියන්නේ: ඔබට හොඳ පුණ්‍ය ගිණුමක් තිබුණා, පාප ක්‍රියා කිරීමෙන් එම ගිණුම සියයට සියයක්ම පාපකාරී වී ඔබ තවත් පාඩු විඳ ගත්තා. ඇතැම් පාප ඉතාමත් ලොකුයි, එයට වඩා සුළු පාපත් තිබෙනවා. රාගය ඉතාමත් තදබලයි. දෙවැන්න කේන්තිය තණ්හාව ඊට වඩා අඩුයි. ඔබ උපයා ගත් දෙය වැඩියෙන්ම සිඳී යන්නේ රාගය නිසා. ලාභ වෙනුවට අලාභ විඳින්න සිදු වෙනවා. සත්ගුරුව අපහාසයට ලක් කරන්නන්ට හොඳ තත්ත්වයක් ලද හැකි වන්නේ නැහැ. ඇතැම් අය පරම පියාට අයිති වී පසුව ඔහුව දමා යනවා. එයට හේතුව කුමක්ද? සාමාන්‍යයෙන් ඔවුන්ට විඳවීමට සිදු වන්නේ රාගය නිසා. එය ඉතාමත් නපුරු සතුරෙක්. මිනිස්සු එහි පඹයෙක් සාදා එය පුළුස්සා දමනවා. කෝපයේ හෝ තණ්හාවේ පඹයෝ සාදන්නේ නැහැ. රාගය මුළුමනින්ම දමනය කළ යුතුයි, ලෝකය ජය ගන්නන් විය හැක්කේ එවිට පමණි. රාවනා රාජ්‍යයේ අපිරිසිදු වී සිටිනා අපව පාරිශුද්ධ කරවීමට පැමිණෙන්වා කියා ඔබ කන්නලව් කරනවා. අහෝ පාරිශුද්ධකරුවාණනි, අපිරිසිදු අයව පිරිසිදු කරවන්නාණනි, සීතාට අයිති රාමා, වඩිනු මැන ! කිය කියා මිනිස්සු කන්නලව් කරනවා. කෙසේවෙතත්, එහි අර්ථය කුමක්දැයි කියා ඔවුන් දන්නේ නැහැ. නව ලෝකය ස්ථාපනය කිරීමට පරම පියා අනිවාර්යයෙන්ම පැමිණෙන බව ඔබ දැන ගෙන සිටියත් මිනිසුන් විසින් එහි කාලපරාසය දික්ගස්වා ඇති නිසා දැන් පැතිරී ඇත්තේ ඝණ අන්ධකාරයක්. ඥානය හා මිත්‍යාව කියා තිබෙනවා. තමන් වන්දනා කරන්නේ කාවදැයි කියා නොදන්නා නිසා භක්තිය මිත්‍යාව වෙනවා. ඉතින් කොහොමද ඔවුන් ඔහු ළගට යන්නේ? මෙන්න මේ නිසා තමයි ඔවුන් කරනා දානමාන පින් දහම් ඵල දරන්නේ නැත්තේ. කපුටෙකුගේ වර්චස් පිඩක් වැනි සුළු තාවකාලික සුවයක් ලැබෙනවා ඇරෙන්න එහි ඇත්තේ දුකම පමණයි. පරම පියා දැන් කියනවා: නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න, ඔබගේ සියලු දුක් දුරු වී යාවි. පැරණි දේ අවසන් වී අළුත් දෙයක් එකතු කර ගත හැකි වන පරිද්දෙන් ඔබ කෙතරම් දුරට ඔහුව සිහි කරනවාදැයි කියා ඔබ දැන් බැලිය යුතුයි. ඇතැම් අය කිසිම දෙයක් උපයා ගන්නේ නැහැ. සියල්ල රඳා පවතින්නේ සිහිකිරීම මතයි. සිහි කිරීමෙන් තොරව ඔබගේ පාප මකා ගත හැක්කේ කෙසේද? උපත් උපතක් පාසා කළ පව් රුසක් තිබෙනවා. එම උපත් ගණනාවක පාප දුරු කර ගැනීමට මෙම උපතේ ජීවිත කතාව බාබාට කීමෙන් පමණක් එය කළ නොහැකියි. මෙම උපතේ පාප බර ටිකක් සැහැල්ලු වෙනවා, නමුත් ඔබ හොඳ උත්සාහයක් දැරිය යුතුයි. උපත් ගණනාවකම කර්ම ගිණුම් සමනය කර ගත හැක්කේ යෝගාවෙන් පමණයි. තමන්ගේ යෝගාව කෙතරම්දැයි කියා ඔබ සිතා බැලිය යුතුයි. මා හට යුගයේ මුලටම ඉපදිය හැකිද? ඉතාමත් හොඳ උත්සාහයක් දරනා අයට පමණයි සත් යුගයේ මුලටම පැමිණිය හැකි වන්නේ. ඔවුන්ට සැඟ වී ඉන්න බැහැ. සැම කෙනෙක්ම ස්වර්ණමය යුගයට යන්නේත් නැහැ. අන් අය අවසානයට අඩු තත්ත්වයක් ලබාවි. මුලදී ආවා නම් ඔවුන්ට දාසයෙක් වීමට සිදු වේවි. මෙය තේරුම් ගත යුතු

සාමාන්‍ය කරුණක්. මෙන්න මේ නිසා තමයි ඔබ ඉතාමත් හොඳින් පරම පියාව සිහි කළ යුත්තේ. අප මෙහි පැමිණ සිටින්නේ නව ලෝකයේ ලෝක පාලකවරුන් වීමට බව ඔබලා දන්නවා. බාබාව සිහි කරනා අය අනිවාර්යෙන්ම සතුටින් සිටීවි. රජ කෙනෙක් වීමට අවශ්‍ය නම් ඔබ අනිවාර්යෙන් පුරවැසියන් සාදා ගත යුතුයි. ඔබ රජ කෙනෙක් වෙන්න යනවා කියා වෙන කොහොම දැන ගන්න ද? මධ්‍යස්ථාන විවෘත කර සේවය කරනා අයත් ආදායමක් උපයා ගන්නවා. ඔවුන්ට මහත් ඵල ලැබෙනවා. තෑගිත් හිමි වෙනවා. ඇතැම් අය මධ්‍යස්ථාන තුන හතර විවෘත කරනවා. කරනා සෑම දෙයකින්ම කොටසක් ඔවුන්ටත් අනිවාර්යෙන්ම හිමි වෙනවා. ඔබ සෑම කෙනෙක්ම එකට එකතු වී මායාගේ දුක් බර දැන් ඔසවා තිබෙනා නිසා සෑම කෙනෙක්ම එයට උරදෙනවා. එමනිසා, සෑම කෙනෙක්ටම ලාභයක් ලැබෙනවා. උත්සාහ දරා බොහෝ පිරිසකට පාර පෙන්වූ අයට ඒ තරමේ උසස් තත්ත්වයක් හිමි වේවි. ඔවුන්ට ලොකු සතුටක් දැනේවි. තමන් කී දෙනෙකුට පාර පෙන්වා තිබෙනවා ද කී දෙනෙකුව ගොඩනංවා තිබෙනවා ද කියා ඔබගේ හදවත දන්නවා. සියල්ලම කිරීමට ඇති කාලය මෙයයි. ඔබට කෑම බීම ලැබෙනවා. ඇතැම් අය කිසිම වැඩක් කරන්නේ නැහැ. බලන්න මමා කොපමණ සේවය කළාද? සේවය තුලින් ඇය බොහෝ පිරිසකට යහපත සැලසුවා. මෙහිත් කිරීමට සේවා කටයුතු රැසක් තිබෙනවා. යෝගාවේත් සේවය තිබෙනවා. එවන් ගැඹුරු උපදෙස් ඔබ ලබනවා. දැන් ඔබ ඉදිරියට යන අතර විවිධ කරුණු මතු වේවි. දවසින් දවස ඒවා වර්ධනය වේවි; අළුත් කරුණු මතු වේවි. සේවයේ නිරත වූවන්ට ඉක්මනින්ම ඒවා ග්‍රහණය කර ගත හැකියි. සේවය නොකරනා අයගේ බුද්ධියේ කිසිවක්ම රඳන්නේ නැහැ. තිතක ස්වරූපය ඔවුන් තේරුම් ගන්නේ කෙසේද? ජීවයක් කොපමණ ලොකු ද කියා ඕනෑම කෙනෙකුගෙන් අසන්න. ජීව සත්තාවන්ගේ දේශය හා කාල පරාසය පිළිබඳව අපට කියන්න! ඒ ගැන කිසිම කෙනෙකුට කිව හැකි වන්නේ නැහැ. පරමාත්ම ජීවයේ නම, රූපය, දේශය හා කාලය ගැන මිනිස්සු අසනවා. ජීව ගැන මෙසේ ඇසුවහොත් ඔවුන් පටලැවිල්ලට පත් වේවි. වෙන කිසිම කෙනෙක් දන්නේ නැහැ. ජීවය එතරම්ම කුඩා තිතක්, එතරම්ම විශාල චරිතයක් ඒ තුළ පටිගත වී තිබෙනවා. මෙහි පවා ජීවය ගැනවත් පරමාත්ම ජීවය ගැනවත් නොදන්නා අය රාශියක් සිටිනවා. තිකම් පාප අත්හැරීම පමණයි ඔවුන් කර ඇත්තේ, ඒකත් පුදුමයක්. සන්‍යාසීවරුන්ගේ ධර්මය වෙනමම එකක්. මෙම ඥානය ඔබලාටයි. පරම පියා පැහැදිලි කරනවා: ඔබලා පාරිශුද්ධව සිටියා දැන් අපිරිසිදු වෙලා. දැන් ඔබ නැවතත් පාරිශුද්ධ විය යුතුයි. උපත් 84 චක්‍රය වටා යන්නේ ඔබ පමණයි. ලෝකයේ සිටිනා වෙන කිසිම කෙනෙක් මේ දේවල් ගැන දන්නේ නැහැ. ඥානය හා භක්තිය එකිනෙකට වෙනස්. ඥානය ඔබව ඉහළට ගෙන යන අතර භක්තිය ඔබව පහළට ඇද දමනවා. ඉතින් දිවා රෑ මෙන් වූ වෙනසක් එහි තිබෙනවා. මිනිස්සු තමන් වේද ග්‍රන්ථ හා පොත්පත් වල සූරයින් කියා සිතා ගෙන සිටියත් ඔවුන් කිසිම දෙයක් දන්නේ නැහැ. ඔබත් ඒ ගැන දන්නේ දැනුයි. ඔබ අතරිනුත් එක් එක් අය එක් එක් මට්ටම් වල සිටිනවා. අමතක වීම නිසා තමයි ඔබගේ සතුට අතුරුදන් වී යන්නේ. නැතිනම් ලොකු සතුටක් තිබේවි. ඔබ මෙම උරුමය ලබන්නේ බාබාගෙනුයි. බාබා ඔබට දර්ශන දෙනවා. කෙසේවෙතත්, දර්ශන දැක්කත් ඔබ ශ්‍රීමත් අනුගමනය කරන්නේ නැතිනම් එහි ඇති ඵලය කුමක්ද? මිනිස්සු දුකට පත් වුණාම පරම පියාව සිහි කරනවා. ගැලවුම්කරුවාණනි! ඕ රාමා! ඕ ප්‍රභූ! කියා කන්නලව් කරනවා. නමුත් ඔහු කවුදැයි කියා ඔවුන් දන්නේ නැහැ. භක්ති මාර්ගයේ කිසිම කෙනෙක්: තමන් ජීවයක් යැයි සලකා පරම පියා සිහි කරන්නැයි කියා කියන්නේ නැහැ. කියන්නේම නැහැ! කිව්වා නම් එය කාලාන්තරයක් තිස්සේ පැමිණි දෙයක් වනු ඇත. භක්තිය දිගටම පැවතෙමින් ආවා. විවිධාකාර වූ භක්ති වන්දනාවන් තිබුණා වුවත් ඥානය ඇත්තේ එකම එක දෙයක් සම්බන්ධයෙනුයි. භක්ති වන්දනාවෙන් තමන්ට දෙවියන් සොයා ගත හැකියි කියා මිනිස්සු සිතනවා. නමුත්, ඒ කොහොමද, කවදාද කියා ඔවුන් දන්නේ නැහැ. භක්තිය ඇරඹෙන්නේ කවදාද වැඩිපුරම භක්ති කරන්නේ කවුදැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. තවත් වසර 40,000ක් පුරාම ඔවුන් භක්ති වන්දනාවල් කරයි ද? එක පැත්තකින් මිනිස්සු භක්තියේ ගැලී සිටිනා අතර අනිත් පැත්තෙන් ඔබලා ඥානය ලබමින් සිටිනවා. මේ මිනිසුන් සම්බන්ධයෙන් ඔබ හොඳින්ම ඔළුව වෙහෙස විය යුතුයි. ඔබ ප්‍රදර්ශන ගණනාවක් පැවැත් වූවා, නමුත් සිය දහසක් අතරින් අතේ ඇඟිලි ගණනක ප්‍රමාණයක් පමණයි මතු වෙන්නේ. ඔබ කී දෙනෙක්ව තමා හා සම තත්ත්වයට පත් කරවා මෙහි ගෙන ආවාද? සැබෑම බ්‍රහ්මින්වරුන් කීදෙනෙක් සිටිනවාදැයි කියා ඔබට දැන් මේ කාලයේ දී ගණනය කළ නොහැකියි. බොරු දරුවනුත් ගණනාවක් සිටිනවා. බ්‍රහ්මින් පූජකවරුන් ආගමික කතාන්දර කියා දුන්නත් බාබා ඔබට කියා දෙන්නේ ගීතාවේ කතාවයි. ඔබත් කියන්නේ එයමයි. බාබා ඒ ගැන කියනා ආකාරයෙන්ම ඔය දරුවනුත් කියනවා. සැබෑ ගීතාව කියා දීම ඔය දරුවන්ගේ රාජකාරියයි. සෑම කෙනෙක් ළඟම ග්‍රන්ථ තිබෙනවා. ඇත්තටම කියනවා නම් සියලුම ග්‍රන්ථ ආදිය අයිති භක්ති මාර්ගයටයි. ඥානය දෙන එකම එක ආගමික ග්‍රන්ථය ගීතාවම පමණයි. ගීතාව තමයි මව පියා. පරම පියාම පැමිණ සෑම කෙනෙක්ටම මුක්තිය දානය කරනවා. එවන් පියෙක්ව මිනිස්සු අපහාසයටත් ලක් කරනවා. ශිව බාබාගේ උපන් දිනය දියමන්ති වටිනවා. ඉහළම ඉහළ දෙවියන්ම පමණයි විමුක්තිය දානය කරන්නා වන්නේ. වෙන කිසිම කෙනෙක්ගේ ගුණ ගායනා කළ හැක්කේ කෙසේද? මිනිස්සු දේවතාවරුන් වන්දනා කරනවා නමුත් ඔවුන්ව දේවතාවරුන් බවට පත් කරවන්නේ පරම පියා පමණයි. අපගේ ස්ථාපනයත් විනාශයත් සිදු වෙමින් පවතිනවා. කිසිම දෙයක් පහදා දීමේ හැකියාව නැති අය රාශියක් සිටිනවා, ඉතින් එමනිසා, ඔවුන් භෞතික වැඩ කරනවා. හමුදාවක වුවත් සියලුම වැඩකටයුතු කරනා අය සිටිනවා. නූගත් අයට උගත් අය ඉදිරියේ දණ නැමීමට සිදු වේවි කියා කියනවා. මමා හා බාබා කරනා දෙයින් ඉගෙන ගන්න. විශේෂයෙන්ම ආදරයට ලක්වුණු දරුවන් කවුදැයි කියාත් ඔබට හඳුනා ගත හැකියි. ඔබ බාබාගෙන් ඇසුවහොත් බාබා නමක් දී කියයි: මෙන්න මෙයාව අනුගමනය කරන්න. සේවයට ලැදි නැති අය අන් අයට මොනවා කියා දෙන්න ද? ඔවුන් තවත් කාලය අපතේ හරීවි. බාබා පහදා දෙනවා: වර්ධනයක් අවශ්‍ය නම් එය ඔබට

මෙහිදී ලබා ගත හැකියි. ඔබ උපත් 84 ගත්තේ කෙසේද කියා පෙන්වන පින්තූරයක් තිබෙනවා. ඔබ මෙය තේරුම් ගෙන තිබෙනා නිසා දැන් අන් අයටත් පහදා දිය හැකියි. එය ඉතාමත් පහසුයි. ඔබ මෙම තත්ත්වයට පත් විය යුතුයි. ඊයේ ඔබ ඔවුන්ව වන්දනා කළා. අද කරන්නේ නැහැ, මන්ද ඔබ දැන් ඥානය ලබා තිබෙනවා. විශාල පිරිසක් පැමිණ ඥානය ලබා ගනීවි. තව තවත් මධ්‍යස්ථාන විවෘත කළ තරමට වැඩි වැඩියෙන් පිරිස පැමිණ දැනුම අවබෝධ කර ගනීවි. ඒ ගැන අහන්න ලැබුණු සැනකින්ම ඔවුන්ගේ සතුටේ රසදිය කඳ ඉහළ නගීවි. ඔබ සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් නාරායන් බවට පත් විය යුතුයි. සත්‍ය නාරායන්ගේ කතාවත් තිබෙනවා. භක්ති කිරීමෙන් මිනිස්සු එන්න එන්නම පහතට වැටිලා. ඥානය යනු කුමක්දැයි ඔවුන් දන්නේ නැහැ. අසීමිත පියා ඔබට නිවැරදිවම මේවා පහදා දෙනවා. බාබා කියනවා: ඊයේ, මම ඔබට අධිරාජ්‍යයක් දුන්නා, කෝ දැන් ඒක කොහේද ගියේ? මෙය නාටකයක් බව ඔබම දන්නවා. මුළු නාටකයේම රහස් ඔබට කියා දෙන්නේ එකම එක පියා පමණයි. අපි කියනවා: බාබා, ඔබ නාටකයේ බැඳීමට බැඳිලා, ඒ නිසා තමයි ඔබට අපිරිසිදු ලෝකයේ අපිරිසිදු ශරීරයකට ඒමට සිදු වී තිබෙන්නේ. මිනිස්සු දෙවියන්ගේ ප්‍රශස්ත ගී ගයනවා. දරුවන් කියනවා: බාබා, අපි ඔබට කතා කළා, ඒ නිසා ඔබ පැමිණ අපට සේවය කළ යුතුයි, අපිරිසිදු අපව පාරිශුද්ධ කළ යුතුයි. සෑම කල්පයකදීම ඔබ අපව දේවතාවරුන් කර යන්න යනවා. මෙය කතාන්දරයක් වගේයි: එය දක්ෂ අයට තිබෙනා කතාන්දරයක්. ඔය දරුවන් සතුටින් සිටිය යුතුයි. බාබාත් නාටකයට අනුව සේවකයෙක් වී සිටිනවා. පරම පියා කියනවා: මගේ උපදෙස් පිළිපදින්න. තමා ජීව බව සලකන්න. ශාරීරික අවධානය අත්හරින්න. නව ලෝකයේ දී ඔබට අළුත් ශරීර ලැබේවි. පරම පියා විසින් ඔබට පහදා දෙන දේවල් හොඳින් ආවර්ජනය කරන්න. තමන් මෙහි පැමිණ සිටින්නේ මේ තත්ත්වයට පත් වීමට බව තේරුම් ගැනීමට ඔබගේ බුද්ධිය මෙහෙය වන්න. ඔබගේ අරමුණ හා ඉලක්කය ඔබ ඉදිරියේ ඇති. මිනිස්සු දෙවියන් මනුෂ්‍යයෙක් කියා සලකනවා, නැතිනම් ඔහු අශාරීරිකයි කියාත් කියනවා. ඔය ජීව සෑම කෙනෙක්මත් අශාරීරිකයි. ඔබ ශරීර ගෙන තම චරිත රඟ දක්වනවා. බාබාත් චරිතයක් රඟදක්වනවා. තමන් අනිවාර්යයෙන්ම රෝසරියේ කොටසක් වේවි කියන විශ්වාසය ඇත්තේ හොඳින් සේවය කරනා දරුවන් තුළ පමණයි. සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් ඔබ නාරායන් විය යුතුයි. අසමත් වුණු විට ඔබ නිසැකයෙන්ම රාමා හෝ සීතා වෙනවා. ඔබට උගන්වන්නේ පරමාත්මයම වන නිසා ඔබ හොඳින් ඉගෙන ගත යුතුයි. කෙසේවෙතත්, මායාගේ විරෝධතාවයනුත් සැහෙන්න තිබෙනවා. මායා කුණාටු ඇති කරවනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඥාන සයුර කලතමින් අප්‍රමාණ සතුටක් විඳින්න. අන් අයට මඟ පෙන්වා දීමට කරුණාවන්ත වන්න. ඔබ ඇසුරු කරන අයගේ පාට වැදී එමගින් පාපතර ක්‍රියාවන් වල නොයෙදෙන්න.
2. මායාගේ දුක නම් වූ බර එසවීමට නම් ඔබ සෑම කෙනෙක්ම එකට එකතුව එයට උරදිය යුතුයි. මධ්‍යස්ථාන විවෘත කර විශාල පිරිසකට යහපත සැලසීමේ උපකරණ බවට පත් වන්න.

**වරදානය:** ඔබ බ්‍රහමින් ජීවිතයේදී සංයුග්ම ස්වරූපයෙහි ඉඳිමින් සැමවිටම ප්‍රමෝදයෙන් සහ සාවධාන ස්වභාවයෙන් සිටිත්වා.

ඕනෑම අවස්ථාවක් තුළ ඔබේ සතුටේ ගති ස්වභාවය වෙනස් වෙනවා නම්, එයට ස්ථිර සතුට යැයි කිව නොහැකියි. ඔබේ බ්‍රහමින් ජීවිතය සැමවිටම ප්‍රමෝදය සහ සාවධාන ස්වභාවයක තබා ගන්න. ඔබේ ගති ස්වභාවය වෙනස් නොවේවා. ඔබේ ගති ස්වභාවය වෙනස් වනවිට ඔබට හුදෙකලා වන්නට අවැසි බව කියනු ඇත. මන්ද, අද ඔබේ මානසික ස්වභාවය එසේ වේ. ඔබ තනිව සිටින විට ඔබේ ස්වභාවය වෙනස් වේ. සැමවිටම සංයුග්ම වී සිටින්න, එවිට, ඔබේ ගති ස්වභාවය වෙනස් නොවනවා ඇත.

**පාඨය:** උත්සවයක් සැමරීම යනු ස්මරණයේ සහ සේවයේ උද්යෝගය තිබීමය.

***** ඕම් ශාන්ති *****

**බ්‍රහ්ම පියාට සමාන වීම සඳහා විශේෂ උත්සාහයන්.**

තීව්‍ර උත්සාහය සඳහා දැන් අරමුණක් තබාගන්න: මා ද්විත්ව ආලෝක සුරදේවතාවකි (ඩබල් ලයිට් ඒන්ජල්). සැරිසරන සුරදේවතාවකගේ අත්දැකීම වැඩි කරගන්න. අශරීර තත්ත්වයේ සිටීම පුහුණුවන්න. එක් තත්පරයක් තුළ ඕනෑම සිතිවිලි, සංස්කාර හෝ ගති ස්වභාවය අවසන් කිරීම සඳහා ද්විත්ව ආලෝකය වී සිටින්න.